# සවියෙන් පෙරට අපි එකට -
# e-ඉගෙනුම් පාසල
## හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම / ඒකකය |
|---|---|---|---|
| 11 | බුද්ධ ධර්මය | 01 | 08. දියුණුවේ හා පිරිහීමේ දොරටු |

සැකසුම - කැලුම් ලියනගේ
බප/ හො/දොඹගොඩ සීලරතන මහා විද්‍යාලය

08

# දියුණුවේ හා පිරිහීමේ දොරටු



# දියුණුව හා පිරිහීම පිළිබඳව දැක්වෙන් සූත්‍ර

- ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
- මහා මංගල සූත්‍රය
- පරාභව සූත්‍රය


(දෙලොව දකින ඇස)
www.mahamevnawa.lk
වයග්සපජ්ජ සූත්‍රය

# ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ නිදාන කතාව

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවෙක "කක්කරපත්ත" නමැති කෝලිය ගමට වැඩම කළහ. එහි දී ව්‍යග්ඝපජ්ජ වංශික "දීඝජාණු" නමැති කෝලිය පුත්‍රයා බුදුරදුන් හමුවීමට ගොස් එකත්පස් ව හිඳ මෙසේ පැවසී ය.

"ස්වාමීනී අපි පස්කම් සුව අනුභව කරමින් අඹු දරුවන් නිසා වන කරදර සහිත ව ගිහි ගෙදර වාසය කරමු; කසී රට සුවඳ සඳුන් පරිභෝග කරමු; මල් ගඳ විලවුන් භාවිත කරමු; රන් රිදී මසු කහවණු ඉවසමු. ස්වාමීනී, මෙසේ ජීවත්වන අපට මෙලොව හිතසුව පිණිස උපකාර වන්නා වූ ධර්මයක් දේශනා කරන සේක්වා."



# මෙලොව හිත පිණිස හේතුවන කරුණු

1. උට්ඨාන සම්පදා
2. ආරක්ඛ සම්පදා
3. කල්‍යාණ මිත්තතා
4. සමජීවිකතා යි.

# උට්ඨාන සම්පදා

ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි "උට්ඨාන සම්පදා" ලෙස හඳුන්වා ඇත්තේ තමන් කරන කවර ම හෝ රැකියාවක් උත්සාහයෙන් (උට්ඨාන විරියාධිගතා) දැතේ මහන්සියෙන් (බහාබල පරිචිතා) දහදිය හෙළා (සේදාවක්ඛිත්තා) ධාර්මික ව (ධම්මිකා) ධාර්මික ක්‍රියා අනුගමනයෙන් (ධම්ම ලද්ධා) ක්‍රියාත්මක කළ යුතු බවයි.

# කළ යුතු ධාර්මික ක්‍රියා

1. කෘෂි කර්මාන්තය
2. වෙළෙඳාම
3. ගවයන් රැක බලා ගැනීම
4. දුනු ශිල්පය හෙවත් ආරක්ෂක සේවාව
5. රාජ්‍ය සේවය
6. වෙනත් ශිල්ප කර්මාන්ත



















# ආරක්ඛ සම්පදා

ධාර්මික ව උපයා ගත් ලෞකික ධනය විනාශ වීමට ඇති ක්‍රම ද අප වටහාගත යුතු ය. එසේ ධනය විනාශ වී යා හැකි ක්‍රම සතරක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් ය.

1. රජයට අයත් වීම
2. සොරුන් විසින් පැහැර ගනු ලැබීම
3. ගින්නෙන් හෝ ජලයෙන් විනාශයට පත් වීම
4. තමා ප්‍රිය නොකරන අයට අයත් වීම





# කල්‍යාණ මිත්තතා

යහපත් මිත්‍රයන් ඇසුරු කිරීම "කල්‍යාණ මිත්තතා" යන්නෙහි අදහසයි. මෙහි දී වෙසෙසින් සැළකිලිමත් විය යුත්තේ මිත්‍රයාගේ වයස හෝ තරාතිරම හෝ නොව ගතිගුණ කෙරෙහි ය. ඔවුන් සතු සද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණ ධර්ම තම ජීවිතයටත් ළං කර ගැනීම කල්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රය තුළින් අපේක්ෂා කළ යුතු ප්‍රමුඛතම කරුණයි.








# සමජීවිකතා

තමාගේ ආදායම හා වියදම හොඳින් දැන අදායමට වඩා වියදම වැඩි නොකොට නොහොත් අය-වැය මනා ව තුලනය කර ගැනීම සමජීවිකතාවයි. අඩු ආදායමක් ඇති ව වැඩියෙන් වියදම් කරන්නා උපමා කර තිබෙන්නේ අවිචාරයෙන් අත්තික්කා කන්නෙකුටයි. (උදුම්බරඛාදික) අත්තික්කා කන්නා ගසට නැග අතු සෙලවුවහොත් ඉදුණු ගෙඩි මෙන් ම මල් හා ගැට ද බිමට වැටෙයි. ඉදුණු ගෙඩි පමණක් කෑමට ගන්නා ඔහු සෙසු ගෙඩි ඉවත දමයි. ආදායමට වඩා වියදම් කරන්නා ද ඒ හා සමාන ය. ඉහළ ආදායම් තත්ත්වයක් ඇති ව ඉතා සුළුවෙන් වියදම් කරන්නා නොකා මැරෙන්නෙකැයි දක්වේ.







ඇතැම් අය තමා ලබන අදායමට වඩා වියදම් කිරීමට පුරුදු ව සිටිති. යම් යම් දේ අනුකරණය කිරීම එයට හේතුවයි. එයින් සිදුවන්නේ නොදැනුවත්ව ම තම පරිහානිය සිදුවීමයි. එබැවින් අය වැය මනා ව තුලනය කර ධනය පරිහරණය කිරීමට "සමජීවිකතා" ප්‍රතිපත්තියෙන් උගන්වා ඇත.


මහා මංගල සූත්‍රය
එක් සමයක බුදුන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන කල,
එක් දෙව් පුතෙක් යහපත් ශරීර වර්ණය ඇතිව සියලු ජේතවනය
බුබුලුවාගෙන යම් තැනෙක්හි බුදුරජාණන් වහන්සේ වසන සේක්ද
එතැනට එළැඹියේය.
බුදුන්ට වැඳ දෙලොව යහපත කැමති දෙවියෝද මනුෂ්සයෝද
මංගල කාරණයන් සිතූහ, එම දෙව්මිනිසුනට අනුකම්පාවෙන්
හිතසුව පිණිස මංගලයන් දේශනා කළ මැනවියි ඉල්ලීය.

මහා මංගල සූත්‍රයේ පුද්ගලයන්ගේ දියුණුවට අදාළ කරුණු 38 ක් දේශිත ය.

1. අනුවණයින් ඇසුරු නොකිරීම
2. නුවණැත්තන් ඇසුරු කිරීම

# 3.  පිදිය යුත්තන් පිදීම



4. සුදුසු ප්‍රදේශයක වාසය කිරීම

5. පෙර කරන ලද පින් ඇති බව

6. සීලාදී ගුණ ධර්මයන්හි පිහිටීම

7. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව

8. ශිල්ප ශාස්ත්‍රයෙහි ප්‍රගුණ බව

9. විනය ගරුක බව

10. ප්‍රිය මනාප වචන කතා කිරීම

# 11. මවුපියන්ට උපස්ථාන කිරීම



12. දරුවන්ට සංග්‍රහ කිරීම

13. භාර්යාවට සංග්‍රහ කිරීම





# 14. නිවැරදි කාය කර්මයන්හි යෙදීම



# 15. දන් දීම



# 16. ධර්මානුකූල ව හැසිරීම



# 17. ඥාතීන්ට සංග්‍රහ කිරීම



# 18. නිවැරැදි ජීවන වෘත්තීන්හි යෙදීම



# 19. පාපයෙහි නො ඇලීම



20. මදයට හා ප්‍රමාදයට හේතුවන මත්ද්‍රව්‍ය පානය නොකිරීම



# 21. කුසල කර්මයන්හි අප්‍රමාද වීම



# 22. තෙරුවන්, මවුපියන් හා වැඩිහිටියන් කෙරෙහි ගෞරව කිරීම



23. යටහත් පැවතුම් ඇති ව විසීම

24. ලද දෙයින් සතුටු වීම

25. කළගුණ දන්නා බව



# 26. සුදුසු කාලයෙහි ධර්ම ශ්‍රවණය කිරීම



# 27. ඉවසීම



# 28. උත්තමයන්ගේ අවවාද පිළිගැනීම



# 29. ශ්‍රමණයන් වහන්සේලා දැකීම



## 30. සුදුසු කල්හි ධර්ම සාකච්ඡා පැවැත්වීම



# 31. තපස



32. බ්‍රහ්ම චර්යාව

33. ආර්ය සත්‍යය දැකීම

34. නිවන පසක් කිරීම

35. ලෝක ධර්මයන්ගෙන් ගැටෙන විට කම්පා නොවීම

36. ශෝක රහිත බව

37. කෙලෙස් නැති බව

38. නිර්භය වීම




බුදුරජාණන් වහන්සේ දේශනා කළ
පිරිහීමට පිවිසෙන දොරටු
පරාභව සූත්‍රය

පරාභව සූත්‍රය ද පුද්ගලයාගේ මෙලොව දිවිපෙවෙත සාර්ථක කරලීම සඳහා බෙහෙවින් ම උපකාර වන්නා වූ ඉගැන්වීම්වලින් යුක්ත ය. මෙය පුද්ගලයාගේ පිරිහීමට හේතු කවරේද යි දෙවියකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් බුදුරදුන් සිදුකළ දේශනයකි. මෙහි පිරිහීමේ කරුණු රාශියක් ගාථා දොළහකින් දේශනා කොට තිබේ.





1. ධර්මයට අකැමැති වීම

2.
- අසත්පුරුෂයන් ප්‍රිය වීම
- සත් පුරුෂයන් ප්‍රිය නොකිරීම
- අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම

3.
- නිතර ම නිදන සුලු බව
- කතාවෙන් ම දවස ගෙවීම
- උත්සාහයෙන් තොර වීම
- අලසකම
- ක්‍රෝධ කරන බව

4. මහලුවියට පත් මවුපියන්ට හැකියාව තිබියදීත් නොසැලකීම
5. බමුණන්, පැවිද්දන් හෝ වෙනත් තවුසන් බොරුවෙන් රැවටීම
6. බොහෝ ධනය, ආහාරපාන තිබියදීත් ඒවා හුදෙකලාව භුක්ති විඳීම
7. ජාතිය, ධනය, ගෝත්‍රය පිළිබඳ මානයෙන් උදම් වී ස්වකීය ඥාතීන් පහත් කොට සිතීම
8. ස්ත්‍රීන් කෙරෙහි, සුරාව කෙරෙහි, දූ කෙළියෙහි ලොල් ව ලත් ධනය විනාශ කිරීම
9. ස්වකීය භාර්යාවගෙන් තෘප්තිමත් නොවී වෛශ්‍යාවන් හා පර අඹුවන් කරා යාම

10. ඉක්මගිය යොවුන් බව ඇති මිනිසෙකු ළාබාල තරුණියක සරණ පාවාගෙන ඇය කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් නොනිදා ඇය රැකීමට වෙහෙසීම
11. රසයෙහි ගිජු වූ නාස්තිකාර ස්ත්‍රියක හෝ පුරුෂයෙකු ආධිපත්‍යයෙහි තැබීම
12. ක්ෂත්‍රිය කුලයෙහි ඉපදුණු ධනයෙන් හීන, මහත් වූ වස්තු තෘෂ්ණාවෙන් යුක්ත අයකු රජකම පැතීම





# ප්‍රශ්න

1. බුදුරජාණන් වහන්සේ මෙලොව ආ හා පරලොව හිතසුව පිණිස කරුණු හතර බැගින් පෙන්වා දුන් සූත්‍ර දේශනාව කුමක්ද ?

වයග්ගපජ්ජ සූත්‍රය

2. එම සූත්‍ර දේශනාව දේශනා කළේ කවරෙකු උදෙසා ද ?

වයග්ඝපජ්ජ වංශික දීඝජානු කෝලිය පුත්‍රයාට

3.එම දේශනාවට අනුව පුද්ගලයකුගේ මෙලොව දියුනුවට හේතුවන කරුණු සතර දක්වා එමගින් මෙලොව ජීවිතය සාර්ථක කරගත හැකි ආකාරය සැකවින් පැහැදිලි කරන්න.

ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දැක්වෙන මෙලොව ජීවිතය සාර්ථක කර ගත හැකි කරුණු හතර වන්නේ උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා,කල්‍යාණ මිත්තතා, සමජීවිකතා වේ.

මෙම කරුණු හතරම පුද්ගල ජීවිතය සාර්ථක කරගැනීම සඳහා අතිශයින් ම අතිශයින්ම ඉවහල් වේ. මෙයින් ප්‍රථම කරුණ වන උට්ඨාන සම්පදා යන්න විමසා බලන විට පුද්ගලයෙකු පුද්ගලයකු තමන් කරන කවර හෝ ‍රකියාවක් උත්සාහයෙන් දැතේ මහන්සියෙන් දහදිය හෙලා ධාර්මිකව ධර්මික ක්‍රියා අනුගමනය කිරීමෙන් සිදු කළ යුතු බව පෙන්වා දෙයි.

උට්ඨාන සම්පදා තුළ රැඳී පවතින්නේ ධාර්මිකත්වයෙන් සුදුසු ‍රකියාවක් සිදු කරන්නේ කෙසේද යන්නයි. සිරියානුවෝ පුද්ගලයකුට මෙම කරුණු අනුගමනය කරමින් සිදු කළ හැකි ධර්මික ‍රකියා කිහිපයක් වේ. එනම්,

කෘෂිකර්මාන්තය, වෙළඳාම , ගවයන් රැක බලා ගැනීම , දුනු ශිල්පය හෙවත් ආරක්ෂක සේවය , වෙනත් ශිල්ප කර්මාන්ත වේ. මෙම යහපත් වන්නාවූ වෘත්තීන්හි නියැලීම තුළින් පුද්ගලයාට දියුණුවේ මං පෙත කරා ළඟාවිය හැකි වන අතර එය මෙලොව දියුණුවට ද හේතුවක් සේ සඳහන් කළ හැකිය.

එසේම අනෙක් කරුණ වන්නා වන්නා වූ ආරක්ඛ සම්පදා පිළිබඳව විමසා බලන විට එය ද දියුණු වන පුද්ගලයෙකුට අත්‍යවශ්‍ය ම කරුණක් වන්නේ ය. මක්නිසාදයත් තමා විසින් උපයාගත් ධනය විවිධ හේතු සාධක නිසා විනාශ වීමේ අවධානමක් මතු වේ. එම නිසා තමා විසින් උපයාගත් ධනය විනාස නොවී ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම වැදගත් වේ. නියමිත කලට රජයට ගෙවිය යුතු බදු මුදල් ආදිය නො ගෙගෙවන කළ රජය විසින් තම ධනය රාජ්‍ය සන්තක කළ හැකිය. එපමණක් නොව නිවැරදි ආරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය නොකළ හොත් තමන් සතු ධනය සොරුන් විසින් සොරකම් කිරීමේ අවදානමක් ද මතු වේ. එපමණක් නොව ගින්න සහ ජලය පවතින ස්ථානයන්හිදී ධනය තැන්පත් කර තිබුණහොත් ගිනි ගැනීම් වලට හා ජල ජල ගැලීම් වලට තම ධනය අසුවීම වැළැක්විය නොහැකිය.

එසේම තමන් ප්‍රිය නොකරන අයවලුන් අතට ධනය පත් වුවහොත් එයින් ද සිදුවන්නේ විනාසයක් ම ය . එම නිසා තමන් සතු දානය ධනය ආරක්ෂා කර ගැනීම කරගැනීම පුද්ගල දියුණුවට මෙන්ම මෙලොව දියුණුවට ද හේතු වන බව සඳහන් කළ හැකිය.තමන් නිවැරදි ආකාරයෙන් මිත්‍රයන් තෝරා ගෙන තෝරා ගෙන ඇසුරු නොකළ හොත් තමන් සතු ධනය මිත්‍රයන්ගේ ක්‍රියාකාරකම් නිසා විනාශ වීමට ඉඩ තිබේ . එම නිසා පාප මිත්‍රයන්ගෙන් දුරස් වී දුරස්වී කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීමට අප පුරුදු විය යුතුය. අප කළණ මිතුරෙකු සොයා ගැනීමේදී කිසිවිටෙකත් මිත්‍රයාගේ වයස හෝ තරාතිරම වැදගත් නොවේ. වැදගත් වන්නේ ගතිගුණ පමණි. එම මිත්‍රයන් සතු සද්ධා , සීල ,චාග ,ප්‍රඥා යන්න ගුණධර්මයන් තමන්ගේ ජීවිතයටද ලං කර ගැනීමේ අරමුණින් යුක්තව අප විසින් කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළ යුතුය. එවිට ගතවන හැම මොහොතකදීම අපට දියුණුවක් අත් වනවා මිසක කිසිදු කලෙක පිරිහීමක් ලගා නොවනු ඇත. එය අපගේ මෙලොව දිවියට අතිශයින්ම වැදගත් වේ.

එසේම සමජීවිකතා නම් වූ අය වැය සමව පවත්වා ගෙන කටයුතු කිරීම ද අපට දියුණු වීමට අදාළව මග පෙන්වීම සිදු කරයි. ආදායමේ තරම දැන වියදම් කිරීම හැම විටම අප විසින් අනුගමනය කළ යුතු වැදගත්ම

ලැබෙන ලැබෙන සෑම මුදලක්ම ඉවක් බවක් නොමැතිව වියදම් කරන්නෙ නම් අපගේ ධනය බලා සිටින විටදී මේ පිරිහීමට ලක් වේ. අප විසින් උදුම්බරඛාදික නොවී අයවැයට අනුව වියදම් කිරීමට පුරුදු වීමෙන් මෙලොව ජීවිතය දියුණු කර කරගැනීමට අවැසි මංපෙත් විවර කර දෙයි.එම නිස ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක් වන්නාවූ මෙලොව දියුණුවට හේතු වන්නා වූ කරුණු නිසි ලෙස අනුගමනය කිරීමෙන් පුද්ගල ජීවිතයන් ජීවිතය සාර්ථක කරගත හැකි බව සඳහන් කළ හැකිය .

# ආයුබෝවන්!